කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

**ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2009**

**2010 ඔක්තෝබර්**

**BMGT E 1045 – ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (අ) සියළුම ගිවිසුම් එකඟතාවයන් වන අතර සියළුම එකඟත්වයන් ගිවිසුම් නොවේ. සුදුසු නිදසුන් යොදා ගනිමින් මෙම ප්‍රකාශයෙහි ඇති වලංගුතාවය විමසන්න.

(ලකුණු 06)

(ආ) පහත ගිවිසුම් අතර ඇති වෙනස්කම් පෙන්වා දෙන්න.

(i) ශූන්‍ය ගිවිසුම් සහ ශූන්‍ය කළ හැකි ගිවිසුම්.

(ii) ඉෂ්ඨ කළ ගිවිසුම් සහ ද්විපාර්ශවීය ගිවිසුම්.

(ලකුණු 08)

(ඇ) අමල් සහ බිමල් හොඳ මිත්‍රයෝ වෙති. අමල් අසනීපයෙන් පසුවූ අවස්ථාවේදී බිමල් ඔහුට සාත්තු කරයි. නමුත් ඒ සඳහා බිමල්, අමල්ගෙන් කිසිඳු ගාස්තුවක් අය කළේ නැත. මේ අතර අමල් ඒ සඳහා බිමල්ගේ පුතා වන ශිරාන් වෙත රු. 5000/= ලබාදීමට පොරොන්දු වෙයි. නමුත් ආර්ථික හේතු මත අමල්ට එම මුදල ශිරාන් වෙත ලබා දීමට නොහැකි විය. ශිරාන් එම මුදල ලබා ගැනීම සඳහා අමල්ට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි. ශිරාන්ට අමල්ගෙන් මුදල් ලබා ගත හැකිවේද?

(ලකුණු 06)

(02) (අ) දාහත්වියැති පාසැල් සිසුවෙකු වූ අජිත් එළඹුනු පහත සඳහන් ගිවිසුම් සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය විමසන්න.

(i) අජිත්, සී/ස ඒබීසී සමාගමෙන් සාමාන්‍ය කොටස් සියයක් මිලදී ගන්නා ලදී. කොටස් සඳහා ඉතිරි මුදල ගෙවන ලෙස සමාගම ඔහුට දන්වූ විට එම මුදල ගෙවීම ඔහු ප්‍රතික්ෂේප කරන ලදී. තවද කොටස් සඳහා මෙතෙක් ගෙවා ඇති මුදල ආපසු ලබා ගැනීමට ඔහු උත්සාහ දරයි.

(ii) අජිත් කමිස සහ පොත් කිහිපයක් මිලදී ගැනීම සඳහා ව්‍යාපාරිකයෙකු වූ නිමල් සමඟ ගිවිසුමකට එළඹුණි. නිමල් එකඟ වූ පරිදි සියළුම භාණ්ඩ අජිත් වෙත සපයයි. නමුත් අජිත් ඒවා සඳහා මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරයි.

(ලකුණු 12)

(ආ) නීතිවිරෝධී බලකිරීම සහ අයුතු බලපෑම අතර වෙනස ගෙන හැර දක්වන්න. ගිවිසුමක වලංගුභාවය සම්බන්ධයෙන් ඒවායේ ඇති බලපෑම කවරේද?

(ලකුණු 08)

(03) (අ) "භාණ්ඩවල අයිතිකරු නොවන සහ භාණ්ඩ වල අයිතිකරුගේ බලය හෝ අනුමැතිය නොමැතිව භාණ්ඩ තොගයක් යම් තැනැත්තෙකු විසින් විකුණුවහොත්, ඒවා මිලදී ගන්නා තැනැත්තාට විකුණූ තැනැත්තාට ඒ භාණ්ඩ සම්බන්ධයෙන් ඇති අයිතියට වඩා හොඳ අයිතියක් නොලැබේ යන්න සාමාන්‍ය රීතියයි."
මෙම රීතියට අදාල ප්‍රධාන ව්‍යතිරේඛ පෙන්වා දෙන්න.

(ලකුණු 12)

(ආ) 2010, ජනවාරි 01 දින මාලන්, ජෝර්ජ් ගෙන් පරිගණක යන්ත්‍රයක් රු. 50,000/= කට මිලදී ගැනීම සඳහා ජෝර්ජ් සමඟ ගිවිසුමක් ඇති කර ගනු ලබයි. මාලන් මිල ගෙවීම පිණිස කාලය ඉල්ලූවිට ජෝර්ජ් සති 04 ක් කල් දෙයි. පරිගණක යන්ත්‍ර භාරගැනීමට උපදෙස් දී තමා වාහනයක් ජනවාරි 02 දින එවන බැව් මාලන්, ජෝර්ජ්ට දන්වයි. ජනවාරි 01 වෙනිදා රාත්‍රියේ සොරුන් ජෝර්ජ්ගේ ගෙය බිඳ වෙනත් භාණ්ඩ සමඟ පරිගණක යන්ත්‍රයද සොරා ගනු ලබයි.
ඉහත අවස්ථාවේදී මතුවන නීතිය පිළිබඳ ප්‍රශ්න සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(04) (අ) අපරානුමැතිය මත ඇති වන නියෝජ්‍යත්වය යනු කුමක්ද? වලංගු අපරානුමැතියක් උදෙසා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි මොනවාදැයි සඳහන් කරන්න.

(ලකුණු 08)

(ආ) බන්දු භාණ්ඩ තොගයක් විකිණීම සඳහා නියෝජිතයෙකු ලෙස අමරව පත් කරයි. භාණ්ඩ විකිණීමේදී සෑම එක් ගණුදෙනුවකම වටිනාකම රු. 50,000/= වඩා අඩු නොවිය යුතු බවට ඔහු තවදුරටත් අමරට උපදෙස් දුනි.
පහත ගණුදෙනු සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයේ නීතිමය තත්ත්වය විමසන්න.

(i) අමර භාණ්ඩ තොගයක් රු. 40,000/= කට පියල්ට විකුණන අතර, ගිවිසුම සඳහා අමර එළඹෙන්නේ ඔහුගේ නමින්මය.

(ii) අමර භාණ්ඩ තොගයක් රු. 55,000/= කට ප්‍රදීප්ට විකුණයි. භාණ්ඩ තොගය එම මුදලට ලැබීමෙන් තමාට ලාභයක් අත්වූයේ යැයි සිතූ ප්‍රදීප් ඒ සඳහා ත්‍යාගයක් වශයෙන් රු. 2500/= ක මුදලක් අමර වෙත ලබාදෙයි.

(ලකුණු 12)

(05) (අ) විනිමය බිල්පතක් සහ චෙක්පතක් අතර ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාද?

(ලකුණු 06)

(ආ) නාමල්, ධාරක බිල්පතක ආදායකයා විය. අදාල බිල්පත ඔහුගේ කාර්යාලයේදී නාමල් අතින් අස්ථානගත වන අතර, පෙරේරා එය අහුලා ගනියි. පෙරේරා එම බිල්පත කසුන් වෙත භාරදෙන අතර, ඔහු එය සද්භාවයෙන් අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවා ලබා ගනියි. බිල්පතෙහි වර්තමාන දරන්නා වශයෙන් කසුන් සතු අයිතිවාසිකම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ඇ) "ගණුදෙනු කළ නොහැක." යනුවෙන් රේඛනය කළ චෙක්පතකින් සහ "ආදායකයාගේ ගිණුමට පමණයි." යනුවෙන් රේඛනය කර ඇති චෙක්පතකින් කුමක් අදහස් වේද?

(ලකුණු 06)

(06) (අ) සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රතිඵල කවරේද?

(ලකුණු 06)

(ආ) සමාගමක් ලියාපදිංචි කිරීම උදෙසා සමාගම් රෙජිස්ටාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන මොනවාද?

(ලකුණු 06)

(ඇ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගමක අධ්‍යක්ෂවරුන් වෙත පැවරෙන්නා වූ කාර්යභාරය කුමක්දැයි සුදුසු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(07) (අ) කාර්මික ආරවුලක් යනු කුමක්ද? විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) 1941 අංක 17 දරණ පඩිපාලක සභා ආඥා පනතේ දක්වෙන පඩිපාලක සභාවක් ස්ථාපිත කිරීමට අදාල වන විධිවිධාන කවරේද?

(ලකුණු 08)

(ඇ) පහත සඳහන් දෑ පිළිබඳව පඩිපාලක සභා ආඥා පනතේ දක්වෙන ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් මොනවාදැයි විස්තර කරන්න.

(i) වැටුප් ගෙවන කාල සීමාව
(ii) අනුමත අඩු කිරීම
(iii) වාර්තා නඩත්තු කිරීම.

(ලකුණු 06)

(08) පහත සඳහන් දෑ පිළිබඳව අවධානය යොමු කරමින් 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත පිළිබඳව සටහනක් ලියන්න.

(අ) සාප්පුව පිළිබඳව නිර්වචනය
(ආ) වැඩ කරන කාලසීමාව
(ඇ) පොදු නිවාඩු
(ඈ) වාර්ෂික නිවාඩු
(ඉ) අනියම් නිවාඩු